www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පුනර්ගවේෂිත අර්වින් ෂූලොෆ්ගේ සංගීතය

## The rediscovered music of Erwin Schulhoff

**ෆ්‍රෙඩ් මාසෙලිස් විසිනි**

**2004 මැයි 11**

විසිවන සියවසේ එක් අප්‍රකට සංගීත සංරචකයකු වූ අර්වින් ෂූලොෆ්ගේ සංගීතයට තනිකරම කැප කෙරුනු ප්‍රසංග තුනක් මෑත සති අන්තයක දී නිව් යෝර්ක් හි පැවැත්වින. ජර්මානු බස කථා කල චෙකොස්ලෝවෙකියානු යුදෙව්වෙකු වූ අර්වින් ෂූලොෆ් 1894 දී ප්‍රාග් හි උපත ලද අතර 1942 දී නාසි වද කඳවුරක් තුල ක්ෂය රෝගය වැලඳීමෙන් මියැදුනේ ය.

පලමු හා දෙවන ලෝක යුද්ධයන් අතරතුර දී තම වෘත්තිචර්යාවන් ඇරඹූවා වූත්, අකල් මරනයන් නිසා හෝ ඇතැම් අවස්ථාවන්හි දී සාපේක්ෂ අප්‍රකටභාවයක් තුල පිටුවහල් වීම නිසා හෝ ඔවුන්ගේ සංගීතය මුලුමනින්ම පාහේ අමතක වනු ලැබුනා වූත් සංගීත සංරචකයන් ගනනාවක් අතරින් ඉතාමත්ම වැදගත් තැනැත්තා ඇතැම් විට ෂූලොෆ් විය හැකි ය. මෑත අවුරුදුවල දී ඔහුගේ සංරචනයන් වඩාත් නිරන්තරවම ඇසෙනු ලැබේ. අප්‍රේල් 30 වන දා සිට මැයි 2 වන දා දක්වා පැවැත්වුනු ප්‍රසංගයන් වනාහි මේවා පිලිබඳ උනන්දුව යලි දැල්වීම සඳහා දැරෙන පුලුල් ප්‍රයත්නයක කොටසකි.

පසුගිය 20 වසරටම තම වෘත්තිචර්යාව, විශාල වසයෙන්ම යුරෝපය තුල පදනම් ව ඇත්තා වූ ද, පැරිස් ඔපෙරාවෙහි ප්‍රධාන මෙහෙයුරුවරයා (conductor) ලෙස මේ දැන් දස වසරක් සපුරමින් සිටින්නා වූ ද, ඇමෙරිකාවේ උපන්, මෙහෙයුරු ජේම්ස් කොන්ලොන් යනු ෂූලොෆ් හා ඔහුගේ සමකාලීනයන්ගේ සංගීතය වෙනුවෙන් පෙනී සිටින්නන්ගෙන් ඉතාමත් කැපීපෙනෙන කෙනෙකි.

මෙහෙයුරු ක්‍රියාකාරීත්වයෙහි තම ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස එක්සත් ජනපදයට පෙරලා පැමිනෙමින් සිටින කොන්ලොන්, අප්‍රේල් 30 වන දා ලින්කන් මධ්‍යස්ථානයෙහි ඇලිස් ට්‍යුලි ශාලාවෙහි පැවැති ෂූලොෆ්ගේ වාද්‍ය වෘන්දීය කෘතීන් පිලිබඳ ප්‍රසංගයේ වැඩසටහන් විස්තර සටහන් වල මෙසේ ලිවී ය. “එලැඹෙන වසරවල දී මෙම සංගීතය ක්‍රමානුකූලව ප්‍රයුංජනය කිරීමට මා අදහස් කරන්නේ, සම්මත පරාසය තුල එය තම ස්ථානය සොයා ගනු ඇතැයි යන අපේක්ෂාවෙනි. මෙම සංරචකයින් කන්ඩායමේ කෘතීන් හැකිතාක් බොහෝ ඇමෙරිකානු හා යුරෝපියානු වාද්‍ය වෘන්දයන් සමගින් වැඩසටහන්ගත කිරීමෙහි ලා මම 2004 වසර කැප කරමින් සිටින්නෙමි. මෙයට ඇලෙක්සැන්ඩර් වොන් සෙම්ලින්ස්කි, වික්ටර් උල්මාන්, පැවෙල් හාස්, බෝහ්‍යුස්ලාව් මාටිනු, එරික් කෝන්ගෝල්ඩ්, කාල් අමදියුස් හාට්මන් සහ අවසාන වසයෙන් අර්වින් ෂූලොෆ් ගේ කෘතීහු ඇතුලත් වෙත්.” මෙම කන්ඩායම අතර සෙම්ලින්ස්කි, මාටිනු හා කෝන්ගෝල්ඩ් කොහෙත්ම අමතක වී නැතත්, ඔවුන්ගේ සංගීතය, ඊට යෝග්‍ය අවධානය ලැබ ගනුයේ කලාතුරෙකිනි.

අප්‍රේල් 30 වන දා වැඩසටහනෙහි ද පැවැති චේම්බර් වාද්‍ය වෘන්දය සඳහා ෂූලොෆ්ගේ ස්වීටයෙහි (1921), පියානෝව හා වාද්‍ය වෘන්දය සඳහා ඔහුගේ කොන්ෂර්ටෝවෙහි (1923), සහ ඔහුගේ අංක 5 දරන සංධ්වනියෙහි පලමු ශ්‍රවනයකින් පවා කොන්ලොන්ගේ අරමුන ඇත්තෙන්ම වටිනා එකක් බව පෙන්නුම් කෙරෙයි. සංගීතමය හා ඓතිහාසික යන දෙ අරුතෙන්ම ෂූලොෆ්ගේ කෘතීන් ඇගයිය හැකි අතර සත්තකින්ම මෙම මූලාංගයන් දෙක සමීපව සම්බන්ධිත ය. එය ලියැවුනු සන්දර්භය, එනම්  දේශපාලනික හා සංස්කෘතික පැසවීමෙහි දශකයන් සහ, වඩාත් පුලුල් අරගලයන්ගේ පිලිබිඹුවක් ලෙස එය වටහා ගැනීමට සේ මල තම කෘතීන් සඳහා ශ්‍රාවකත්වයක් සොයා ගැනීම පිනිස ද බොහෝ කලාකරුවන් මෙම වසරවල් අතරතුර දී යත්න දැරූ ආකාරයන් සැලකීමෙන් තොරව මෙම සංගීතය ශ්‍රවනය කල නොහැකි ය. නිශ්චිතවම මෙය වනාහි අමතක නො කල යුතු සංගීතයකි.

සමෘද්ධිමත් සහ ශික්ෂිත වූ පවුලක උපත ලද ෂූලොෆ් ලමා ප්‍රවීණත්වයක් (සුධීමත්භාවයක්) වැනි යමක් සමගින් ඉක්මනින්ම මතු ව ආවේ ය. ද්වෝරැක්, 1901 දී ඔහු පියානෝව වාදනය කරන අයුරු ඇසූ කල, මෙම සත් හැවිරිද්දාගේ ශ්‍රේෂ්ඨ සංගීතමය අනාගතයක් පිලිබඳව අනාවැකි පල කලේ ය. ලිප්සිග්හි හා කොලෝන්හි කලා ශාලිකාවන්ට පසුව, ෂූලොෆ් අධ්‍යයනය සඳහා ප්‍රාග් නුවර බලා ගියේය. ඔහුගේ ගුරුවරුන් අතර මැක්ස් රෙගර් හා ක්ලෝඩ් ඩෙබ්‍යුසි යන සංරචකයෝ ද සිටිය හ. තම වයස විසි ගනන් වලට එලැඹුනු කල හෙතෙම, ප්‍රයුංජනය හා සංරචනය යන දෙ අංශයෙන්ම ඉමහත් දක්ෂතාවයක් ප්‍රදර්ශනය කලේ ය. ඔහු, “ප්‍රශස්ත තාක්ෂනයකින්, අසමාන ධාරන ශක්තියකින් හා සටන්කාමී අර්ථකථනීය අධිෂ්ඨානයකින් යුතු, විශේෂයෙන් නව සංගීතය සඳහා ම උපන්, කැපී පෙනෙන වෛශාරදීය පියානෝ වාදකයෙකි; තිරසාර ලෙස දෙපය ම මහ පොලොවේ ගසා සිටින විප්ලවීය සංරචකයෙකි” යැයි ප්‍රාග්

විචාරකයකු පැවසීය.

තරුන සංගීතඥයා, විනාශයට නියමිත වූ ඔස්ට්‍රෝ හංගේරියානු අධිරාජ්‍යයේ හමුදාවෙහි දී යුද්ධ කාලය ගත කළ අතර තම පරම්පරාවේ බොහෝමයක්ම දෙනා කල අයුරින් ඔහු ද මෙම අත්දැකීම වෙතින් ඉහලට මතුව ආවේ, එය තිත්තව හා රැඩිකලීකෘතව ය. 1919 ජනවාරියෙහි ඩ්‍රෙස්ඩන් කරා ගිය හෙතෙම මීලඟ සිව් වසර ගෙවා දැම්මේ ජර්මනියෙහි ය.

ලෝක යුද්ධයේ ව්‍යසනයට ලොව ඇද දමා තිබූ පැරනි පර්යායෙහි පරිහානියත් සමග සාම්ප්‍රදායික සංගීතමය ආකෘතීන් එම පර්යායට සම්බන්ධ කරමින් ෂූලොෆ් ඒවායෙන් ඉවතට හැරුනේ ය. කෙටි කලකට හෙතෙම ඩාඩාවාදය වැලඳගත් නමුත් ඉක්මනින්ම එහි වඩාත් නාස්තිකවාදී ප්‍රකාශනයන්ගෙන් තමන්ව ඈත් කර ගත්තේ ය. ඔහුගේ මිතුරන් හා සහායකයන් අතරට, ජෑස් (jass) සංගීතය කෙරෙහි සහ රැග්ටයිම් (rag-time) සංගීතය කෙරෙහි ඔහු තම උද්‍යෝගය බෙදා හදා ගත් සහ චේම්බර් වෘන්දය උදෙසා කල තම ඉහත සඳහන් ස්වීටය පුද කල ජෝර්ජ් ග්‍රොස් නම් කලාකරුවා ද විය.

මෙම වසරවල් අතරතුර දී ෂූලොෆ් තම යුගයේ සංගීතය තුලට ඇද වැටුනේ ය. (හෙතෙම ලිපි හුවමාරු කරගත්) ෂෝඑන්බර්ග් හා ඇල්බන් බර්ග් යන සංගීතඥයන්ගේ නිෂ්තානතාවය (atonality) ද ස්ට්‍රාවින්ස්කි හා හින්ඩමිත්ගේ නව සම්භාව්‍යවාදය ද ඇතුලත් විවිධාකාර සමකාලීන ගුරුකුලයන්ගේ සංගීතයෙන් හෙතෙම ආභාසිත වූ අතර ඔහු ඒවා නිරතුරුවම පාහේ ප්‍රයුංජනය කලේය. බාර්ටොක් හා සුවිශේෂයෙන්ම චෙකොස්ලෝවෙකියානු සංරචක ලියොස් ජැනාසෙක්, ඔහුගේ අනෙකුත් ආභාසයන්ට ඇතුලත් විය. ජැනාසෙක් ෂූලොෆ්ට වඩා වසර 40 කින් ජ්‍යෙෂ්ඨ වූ නමුදු, හෙතෙම තමන්ගේ ශ්‍රේෂ්ඨතම කෘතීන්ගෙන් සමහරක් සංරචනය කලේ 70 හැවිරිදි වියට ආසන්නව සිටි මෙම කාල පරිච්ඡේදය අතරතුර දී ය. ෂූලොෆ්, ජැනාසෙක්ගේ ජීවිතය හා කෘතීන් පිලිබඳ රචනයක් ලිවීය.

ෂූලොෆ්ගේම සංරචනයන් වූ කලී සරලව ම මෙකී ආදි නූතනවාදීන්ගේ අනු කෘතීන් නො වී ය. ඔහුගේ කෘතීන් පැහැදිලිවම ඔවුන්ගේ ආභාසය පෙන්වන නමුදු, තමන්ගේම සුවිශේෂිත හඬක් සොයාගැනීමට හෙතෙම සමත් වූයේ ය. එය එක්තරා ආකාරයකින් ප්‍රකාශනවාදයේ හා නව සම්භාව්‍යවාදයේ සංකලනයක් විය.

ඉහත කරුන යම් අයුරකින් නයගැති වන්නේ, ඔහු තමන්ට හැකි සෑම දෙයම උකහා ගැනීමට ඉමහත් ලෙස කුතුහලජනක හා උනන්දුජනක වූවේය යන්නට ය. තම වයස අවුරුදු 30ක් වීමටත් පෙර රචනා කරන ලද "සුවීටය" හා "පියානෝ කොන්ෂර්ටෝව" යන නිර්මානද්වයෙන්ම ඔහුගේ නිර්ව්‍යාජ නිර්මානශීලීත්වය ප්‍රදර්ශනය විය.

ජෑස් සංගීතය, ෂූලොෆ්ගේ සංරචනය තුල සුවිශේෂිතව ම වැදගත් ක්‍රියා කලාපයක් ඉටු කලේ ය. ස්ට්‍රාවින්ස්කි, රැවෙල් හා ඩේරියස් මිල්හෝඩ් ආදී අන් සංරචකයන්ට වෙනස් ලෙස ජෑස් කෙරෙහි ෂූලොෆ් ප්‍රවිශ්ට වූයේ කෙසේ වත්, එදෙස බලන පිටස්තරයකු ආකාරයෙන් නො වේ. මෙම කාල පරිච්ඡේදය අතරතුර හෙතෙම ජෑස් පියානෝ වාදකයකු ලෙස කටයුතු කලේ ය. ඔහුගේ ජෑස් ආභාසිත සම්භාව්‍ය සංගීත සංරචනයන්, තම ආසන්න සමකාලීනයකු වූ කුර්ට් වයිල්ගේ එබඳු සංරචනයන්ටත් වඩා ඈතට කාලයකට දිවෙයි. නිව් යෝර්ක් හි දී පියානෝ වාදක ඩේවිඩ් ග්‍රයිල්සමර් ද සමග කොන්ලොන් සහ ජුලියාඩ් වෘන්දය විසින් ප්‍රයුංජනය කල, ඒක චලන සංගීත බන්ධයක් වන ඔහුගේ "ජෑස් කොන්ෂර්ටෝව" සම්පූර්න කෙරුනේ, වඩාත් වැඩියෙන් ජනප්‍රිය භාවයට පැමිනීමට නියමිත වූ වෙනත් "ජෑස් කොන්ෂර්ටෝවක්" වූ ජෝර්ජ් ගර්ෂ්වින් ගේ රැප්සොඩි ඉන් බ්ලූ (Rhapsody in Blue) හි මංගල ප්‍රයුංජනය, 1924 පෙබරවාරියෙහි දී නිව් යෝර්ක් හි පැවැත්වීමටත් මාස ගනනාවකට පෙර ය.

මේ සංරචකයන් දෙදෙනා තමන් එකිනෙකාගේ කෘතීන් පිලිබඳ කිසිවක් එකල දී දැන නොසිටි බව නිශ්චිත ය. එමෙන්ම ඔවුන්ගේ පොදු ජෑස් ආභාසයන් තිබිය දී ම මෙම සංගීතමය කෘතීන් ඉතා වෙනස් ය. කාව්‍යාත්මක හා රොමෑන්ටිකවාදයෙන් පැහැගැන්වුනු ගර්ෂ්වින්ගේ කෘතිය, ඊට උචිත පරිද්දෙන්ම පැවත ඇත්තේ, එම වර්ගයේ අතිශයින්ම ජනප්‍රිය කෘතීන්ගෙන් එකක් ලෙසිනි. ෂූලොෆ්ගේ කොන්ෂර්ටෝව ඉතාමත් කර්කශ, ප්‍රකෝපකාරී හා පර්යේෂනාත්මක එකකි. මෙම මුල් සහ සිත් ඩැහැගන්නා කෘතිය, ඉතා පුලුල් ලෙස ශ්‍රවනය කිරීමක් සඳහා යෝග්‍ය වෙයි.

සමකාලීන සංගීතමය දර්ශන පථයෙහි "දෙමුහුන්" යනුවෙන් හැඳින්වීමට පටන් ගැනී ඇති යමෙක කිසිදු මූලාංගයක් ෂූලොෆ්ගේ කෘතිය තුල දක්නට නැත. මෙය වනාහි, හදිසි ජනප්‍රියත්වය උදෙසා නිරායාසකරත්වය හා නිර්ව්‍යාජත්වය සිරිත් පරිදි අතහැර දමන "සැහැල්ලු" සම්භාව්‍යවාදය නො වේ. ෂූලොෆ්ගේ කොන්ෂර්ටෝව විස්මයන්ගෙන් පිරුනු නමුදු එය නැගී එනුයේ සංස්ථිතික සංගීතමය ප්‍රකාශනයක් පරිද්දෙනි. නිදසුනකට අවසාන කොටස, *අලෙග්‍රෝ අලා ජෑස්* යනුවෙන් සලකුනු කෙරී තිබෙන අතර සයිරනය, කාර් නලාව, කිනිහිරය, ගව කිංකිනි, රැටලය, තාලම, ජපන් බෙරය සහ, -ඩේවිඩ් රයිට්ගේ අප්‍රේල් 30 වන දා වැඩසටහන් විස්තර සටහන්වල කුලුගැන්වුනු පරිදි,- "මොනම තථ්‍ය ජෑස් සංගීත කන්ඩායමක හෝ අශිෂ්ට ම පරිකල්පනාවන්ගෙන් පවා ඔබ්බෙහි පවතින වෙනත් තාල වාද්‍ය ආම්පන්න" භාවිතා කරයි.

කොන්ෂර්ටෝවට දෙවසරකට පෙර සංරචිත ඩාඩාවාදය ආභාසිත චේම්බර් වෘන්දය සඳහා ස්වීටය ඇරඹෙනුයේ සැබෑ ඩාඩා ශෛලියෙන් යුතු කෙටි සුනරුත් කවියකිනි.

දෙනු මැනවි මට නොඇසූ විරූ බලයන්
කා දමමි මම නුඹ සැවොම

උඹලත් එක්ක සොසේජ් මැසිමට
උෟරනේ ....
ඊලඟට, ඔව්, ඊලඟට එයි විශ්වයේ ක්ෂනය
“බේයර් ඇස්පිරින්” වලට මාව හැරවෙන

එය හා අනුගමනය වන සංගීතයෙහි පුරාජේරු සහගත ලෙස ප්‍රකම්පනීය හෝ සිතා මතා ම සැඟවුනු කිසිවක් නැත. ස්වීටය සංරචිතව ඇත්තේ, රැග්ටයිම්, වාල්ස් බොස්ටන් (එකල ජනප්‍රිය නැටුමකි), ටැන්ගෝ, ෂිමී, ස්ටෙප් හා ජෑස් යනුවෙන් නම් කෙරුනු ප්‍රහර්ශනීය හා නිර්ව්‍යාජ කොටස් හයකිනි. මෙහි සංගීතය රැවෙල්ගේ හෝ ෆ්‍රැන්සිස් පුලෙන්ක්ගේ සංගීතය සිහියට නංවයි.

1930 ගනන් මුල් භාගයේ දී ෂූලොෆ්ගේ සංගීතමය චාරිකාපථය මූලික වෙනසකට බඳුන් විය. 1920 ගනන් අග භාගයේ ද 1930 ගනන්වල මුල් භාගයේ ද සමාජ නැගිටීම් සහ ෆැසිස්ට්වාදයේ නැගීමත් 1933 ජනවාරියේ දී ජර්මානු චාන්සලර් ධුරයට හිට්ලර්ගේ ආරෝහනයත් තුල, නාසිවාදයට එරෙහි සටනෙහි ආරක්ෂක ප්‍රාකාරයක් ලෙස ඔහු දුටු කොමියුනිස්ට් පක්ෂය සහ සෝවියට් සංගමය කරා ෂූලොෆ් වඩ වඩාත් නැඹුරු වූයේ ය. මෙම ඛේදනීය දේශපාලනික ව්‍යාකූලත්වය පුද්ගලික දෝෂයක් නො වී ය. එය පැන නැගුනේ, මහා අවපාතය හා කොමියුනිස්ට් ජාත්‍යන්තරය විසින් පාවා දෙනු ලැබුනු නව විප්ලවවාදී අර්බුදය සමග, සෝවියට් සමූහාන්ඩු සංගමයේ හුදෙකලාවත් ස්ටැලින්වාදී නිලධරයක වැඩීමත් සමපාත වූ, සමස්ත ලෝක තත්වය කෙරෙනි. සෝවියට් සංගමය, රුසියානු විප්ලවය සමග සම්බන්ධ කරමින් මිලියන ගනන් කම්කරුවන් හා බුද්ධිමතුන් එදෙසට හැරුනේ, හරියටම ස්ටැලින්වාදීන් 1917 ඔක්තෝබර් අරගලයේ සමස්ත නායකත්වය සම්පූර්නයෙන්ම අතුගා දැමීමට සැරසෙමින් සිටියදී ය.

විවෘතවම දේශපාලනික හා උපදේශාත්මක වූත්, පර්යේෂනීයත්වය හෝ පෙරටුගාමීත්වය වැලැක්වූවා වූත් සෞන්දර්යවාදයක් වෙනුවෙන් තම පූර්ව කෘතීන් ඉවත ලමින්, ෂූලොෆ් ස්වේච්ඡාවෙන්ම හා උද්‍යෝගීමත්වම “සමාජවාදී යථාර්ථවාදය” වැලඳගත්තා වූ වාතාවරනයන් වූයේ මේවා ය.

කොමියුනිස්ට් ප්‍රකාශනය මත පාදක වූ කැන්ටාටාවක් සංරචනය කිරීම තරම් දුරකට අප සංරචකයා ගමන් කලේ ය. ඔහු මහා පරිමාන කෘතීන් නිර්මානය කෙරෙහි නැඹුරු වූයේ, 1933 වසර හා ඔහුගේ මරනය අතරතුර කාලය තුල දී තම අවසන් සංධ්වනි පහ සංරචනය කරමිනි. තෙ වන සංධ්වනිය රචනා පුද කෙරුනේ ස්ලෝවෙකියාවේ උපවාසකරුවන් වෙනුවෙන් වූ අතර සිව්වැන්න ස්පාඤ්ඤ සිවිල් යුද්ධයේ සටන්කරුවන් උදෙසා පුද කෙරුනි. ආකාරගත කාර්ය පරිපාටියක් නැතත් පස්වැන්න බෙහෙවින්ම නිමැවී ඇත්තේ, ස්ටැලින්වාදීන්ට පිලිගතහැකි “වීර” අච්චුවෙහි ලා ය. එහි චලනයන් හතර සමන්විත වනුයේ, මන්ද චලනයන් දෙකකින් [*අන්දාන්තේ* චලනයක් *(Andante)* හා ඊට පසුව යෙදෙන *අදාගියෝ* චලනයක් *(Adagio)*] ද, ඊට පසු එන *අලේග්‍රෝ (Allegro)* චලනයන් දෙකක් ද මගිනි. සංධ්වනිය, එය මුල සිට අග දක්වාම බොහෝ සෙයින් රනකාමී, ගම්භීර හා ශෝචනීය වෙයි. මෙම ශ්‍රාවකයාට අනුව එය ඔහුගේ ආදිතම කෘතීන්ගේ ජීවාග්නියෙන් තොරය.

එහෙත් මෙම සංගීතයෙහි තවමත් අගය කිරීමට බොහෝ දෑ තිබේ. හෙතෙම අවමංගත ව සිටියේ වීමට ඉඩ තිබෙතුදු, මෙම ඉමහත් සේ දක්ෂ හා ආත්ම පරිත්‍යාගශීලී කලාකරුවා අත “සමාජවාදී යථාර්ථවාදය” වනාහි, ස්ටැලින්වාදී බඩගෝස්තරවාදීන්ගේ හා නිවටයන්ගේ කෘතීන්හි එය අත්පත් කොටගත් ප්‍රකාශනය හා සම නො වී ය. දිමිත්‍රි ෂොස්ටකොවිච් විසින් සංරචිත ක්‍රෙම්ලිනයේ ප්‍රසාදය හිමි වූ බලගතු කෘතීන් (නිදසුනකට පස් වන හා හත් වන සංධ්වනීන්) සහ සෝවියට් සංගීතමය සංස්ථාපිතය තුල සමාජවාදී යථාර්ථවාදයේ “නිල” වෘත්තිකයන් විසින් මුට්ටු කොට ඉදිරිපත් කල සම්පූර්නයෙන්ම අමතක වන සුලු හා නොවැදගත් කෘතීන් අතර ඇති වෙනස එයයි.

ෂූලොෆ්ගේ පස්වන සංධ්වනිය සංරචිත වූයේ 1938 වසරේ පෙබරවාරි සහ 1939 වසරේ මැයි මාසයන් අතරතුර දී ය. සංරචකයා සෝවියට් පුරවැසිභාවය ලැබගත් නමුදු සෝවියට් සමූහාන්ඩු සංගමයට සංක්‍රමනය වීම ප්‍රතික්ෂේප කලේ ය. චෙකොස්ලෝවැකියාවේ නාසි ග්‍රහනයට පසුව වැඩක් සොයා ගැනීමට ඔහු අසමත් වූ අතර, 1941 ජූනි මස, සෝවියට් සංගමයට ජර්මානු ආක්‍රමනය කෙරුනු දිනට පසුව අත් අඩංගුවට ගැනින. මාස 14කට පසුව 1942 අගෝස්තු 18 වන දා හෙතෙම වුල්ශ්බර්ග් වධ කඳවුරෙහි දී මිය ගියේ ය.

අර්වින් ෂූලොෆ් හා ඔහුගේ ඇතැම් සමකාලීනයන්ගේ සංගීතමය උරුමය පුනර්ජීවනය කිරීම, සරලවම අමතකවූ සංරචනයන් රස විඳීමට වඩා වැඩි යමක් හා සබැඳේ. ජේම්ස් කොන්ලොන් තම වැඩසටහන් විස්තර සටහන්හි පැහැදිලි කරන ආකාරයට, “මෙම මුලුමහත් ‘අහිමි පරපුර’ ම ශ්‍රවනය කල යුතු සාරයක් / ජීව ගුනයක් මූර්තිමත් කරන බව මම විශ්වාස කරමි. 20 වන සියවසේ මුල් භාගයෙහි නිර්මානශීලීත්වය අප සිතනවාටත් වඩා බෙහෙවින්ම පොහොසත් ය. ස්ට්‍රාවින්ස්කි, ස්ට්‍රාවුස් හා අනෙකුත් ප්‍රධාන හා වඩා වාසනාවන්තයින් ද සමගින් බර්ලිනය, වියෙනාව, ප්‍රාග් හා බුදාපෙස්ට් යන නුවරවලින් පැමිනි යුදෙව්, සංස්ථාපිත විරෝධී, හෝ සංක්‍රමනීය හෝ වේවා, මේ සංරචකයන්ගේ විවිධාකාර හඬවල්, ඔවුන්ගේ යුගයේ සංගීතමය පැසවීම පිලිබඳව බොහෝ දෑ අනාවරනය කරයි. ෂූලොෆ් පිලිබිඹු කරන්නේ, පලමු ලෝක යුද්ධයේ සිට 1940 ගනන්වල මුල්භාගය තෙක් විහිදෙන යුගයෙහි තරුන සමාජවාදී යුදෙව් බුද්ධිජීවීන්ගේ කලාත්මක වාතාවරනයයි. … ඒකාධිපතීත්වයේ ගොදුරු බවට පත් වූවන්ගේ සංගීතය සජීවීව පවත්වා ගැනීම මගින් අපි මෙම තන්ත්‍රයන්ට

කිසිදු අපර අභාවීය (posthumous) ජයග්‍රහනයක් ඇතැයි යන්න ප්‍රතික්ෂේප කරන්නෙමු. වර්ගවාදී හෝ බහිෂ්කරනිය දෘෂ්ටිවාදයක පදනම මත කලාත්මක ප්‍රමිතීන් නිර්නය කිරීම සඳහා වන ඕනෑම සමකාලීන හෝ අනාගත පෙලැඹවීමකට ප්‍රතිරෝධය පෑම සඳහා සිහිපත් කාරකයක් ලෙස, මෙම සංගීතයෙහි පුනර්ජීවනයට සේවය කල හැකිය..."

කොන්ලොන් මතු කරන්නේ ඇතැම් අතිශයින්ම වැදගත් සහ සංකීර්න වන කරුනු කිහිපයකි. නූතන සංගීතයෙහි පිලිගත හැකි "එකම" ආකාරය හැටියට ශාස්ත්‍රාලයීය අනුක්‍රමීයවාදය (serialism) විසිවන සියවසේ පසු අඩෙහි බොහෝ කොටසකම ලත් ජයග්‍රහනය බැඳී පවතින්නේ, වෙනත් මාවත් සෙවූ සංරචකයන්ගේ අහිමි වීම සමගිනි. තම කෘතීන් හා තමන්ගේ ශ්‍රාවකයන් අතර කිසිදු පරතරයක් නො තිබූ ෂුලොෆ් හා අනෙකුන්ව අමතක කොට දැමිනි; නැතහොත් නො තකා හැරිනි. අහිමිව ගියේ ෂුලොෆ් පමනක් නො වේ. බහුජන ශ්‍රාවකයක් උදෙසා සංරචනය කිරීම සහ බහුජන ශ්‍රාවකයක් උගන්වා ගැනීම සඳහා දැරෙන මොන ම උත්සාහයක් වුව නිරර්ථක වූත්, විනාශය කරා පමනක් යොමු කරවනු ඇත්තා වූත් දෙයකැයි තර්ක කිරීම සඳහා දේශපාලන අපේක්ෂා භංගයන් සහ විශේෂයෙන්ම ස්ටැලින්වාදයේ ක්‍රියාකලාපය, උපයෝගී කර ගැනුනි. "බැරෑරුම්" සංගීතය ප්‍රභූ පෙලැන්තිය සඳහා පමනක් වූ අතර මහජනයාට අවශ්‍යවූයේ හා යෝග්‍යවූයේ යැයි සැලකුනේ ධනවාදී වානිජ්‍යයේ ලෝකයෙන් ඔවුන් වෙත විසි කල දෑ පමනි.

පෙරටුගාමී සංගීත ලෝකය සහ දේශපාලනය අතර ඇත්තේ එක්තරා වර්ගයක, සුපැහැදිලි නමුදු ඉතා රලු වන සමාන්තරයකි. "සමාජවාදය මිය ගොසිනි" යනුවෙන් නිවේදනය කිරීම අද කාලයේ දී හරියටම සාම්ප්‍රදායික පාන්ඩිත්‍යයක් වන්නා සේ ම සම්භාව්‍ය සංගීතය මිය ගොසිනි යනුවෙන් පැවසීම ඇතැම් කවයන් තුල විලාසිතාවකි. එය එක් අතකින් සංරචනය කරන්නන්ට පිටස්තරව කිසිවෙක්ම පාහේ ශ්‍රවනය නොකෙරෙන "නූතන" සංගීතයටත්, අනෙක් අතින් විශාලම ශ්‍රාවකය උදෙසා වන වඩ වඩාත් "පිරිහෙලුනු" සංගීතයටත් මග පාදා ඇත.

කිසිදු සැකයකින් තොරව ම, සංගීතය යනු කලාත්මක ආකෘතීන්ගෙන් අතිශයින්ම අමූර්ත ප්‍රකාරය වන අතර සංගීතමය සංරචනයක් මතට දේශපාලනික හෝ ක්‍රියාමාර්ගික අන්තර්ගතයක් එබ්බීම නිර්මානාත්මක කලාකරුවා තම ගමන ඇරඹිය යුතු අව්‍යාජත්වයට විසංවාදී වේ. එහෙත් සංරචකයා තමන්ව ලෝකයෙන් කැපී වෙන් කොට ගත යුතු බවක් ඉන් අදහස් නොකෙරේ. ෂුලොෆ්ගේ නිර්මානශීලී චාරිකාපථය වනාහි පැටලිලි සහගත වූවකි. අවසාන වසයෙන් ඔහුගේ අරගලය අකාලයේ අවසන් විය. ශ්‍රාවකයා සමග සම්බන්ධ වන්නා වූ මනෝභාවික අන්තර්ගතයක් ද සමගින්, යථා ලෝකය පිලිබිඹු කරන සංගීතමය භාෂාවක් වර්ධනය කිරීමේ ඔහුගේ ප්‍රයත්නයෙන් උගත යුතු බොහෝ දෑ තිබේ.

සම්භාව්‍ය සංගීත සම්ප්‍රදාය සරලව ම මියැදී හෝ අතුරුදන් වී නැත. කොන්ලොන් හා අනෙකුත් සංගීතඥයෝ, විසි වන සියවසේ සංස්කෘතික පැසවීමේ හා අරගලයේ සැබෑ ඉතිහාසය පුනර්ජීවනය කිරීමේත්, මෙම ඉතිහාසයෙන් ඉගෙන ගැනීමේත් අවශ්‍යතාවය අවධාරනය කරති. සත්තකින්ම දේශපාලනය සම්බන්ධයෙන් ද එය ම කිව හැකි අතර එසේ ම කිව යුතු ය. මෙම සන්දර්භයේ දී සිත්වලින් මැකීයාමට ආසන්න වූ සංගීතමය පෙරටුගාමීත්වයක් පිලිබඳ කරුන අද දවසේ නැගී එනුයේ මන්ද යන්න අප සලකා බැලිය යුත්තෙමු. ප්‍රශ්න කල නොහැකි ලෙසම එය සම්බන්ධ වී ඇත්තේ, මුල දී වක්‍ර හා යාන්තමින් පමනක් ග්‍රහනය කලහැකි මට්ටමින් වුව ද වැඩෙමින් පවතින දැනුවත් භාවයකට ය. එනම් විසිවන සියවසේ නොවිසඳුනු දේශපාලනික කාරනාවන් නැවතත් විසි එක්වන සියවස තුල ඉදිරිපත් කෙරෙමින් පවතින බව පිලිබඳ දැනුවත් භාවයකට ය.

© www.wsws.org